ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ඌව පළාත් ආයුර්වේද කොමසාරිස්,
ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, බදුල්ල / මොණරාගල,
වෛද්‍ය අධිකාරී, මූලික රෝහල, දියතලාව/ බණ්ඩාරවෙල/වැලිමඩ/ මහියංගණය/වැල්ලවාය/
සියඹලාණ්ඩුව / මහාචාර්ය සේනක බිබිලේ අනුස්මරණ රෝහල

**<u>ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා / ආයුර්වේද/ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවල PL-01/PL-02 හා PL-03 කාණ්ඩවලට අයත් දෙපාර්තමේන්තුගත තනතුරුවල III වන, II වන හා I වන ශ්‍රේණිවල සේවයේ නියුතු නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - 2026</u>**

ඌව පළාත් සභාවේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ආයුර්වේද දෙපාර්තමේන්තුව සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල PL-01, PL-02 හා PL-03 කාණ්ඩයන්ට අයත් දෙපාර්තමේන්තුගත තනතුරුවල III වන, II වන හා I වන ශ්‍රේණිවල සේවයේ නියුතු නිලධරයන් සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටිවලට අනුකූලව පැවැත්වීමට නියමිත වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ 2026 ජූලි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**<u>PL 01 කාණ්ඩය</u>**

**<u>ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව</u>**

- <u>ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු- III/ II/ I ශ්‍රේණි</u>
  - සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) } ( ඌව පළාත් ආයුර්වේද / සෞඛ්‍ය දෙපාර්තමේන්තුව)
  - සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය) }
  - විදුලි සෝපාන ක්‍රියාකරු (ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව)
  - ඉසීම් යන්ත්‍ර ක්‍රියාකරු (ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව)
  - මුරකරු (ඌව පළාත් ආයුර්වේද /සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව)
  - කාර්යාල කාර්ය සහයක (ඌව පළාත් ආයුර්වේද / සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව)
  - කාර්යාල කම්කරු }
  - බංගලා භාරකරු } (ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව)
  - බෙහෙත් ශාලා කම්කරු }
- <u>සෞඛ්‍ය කර්යාල කාර්ය සහායක සේවය (ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව/ ආයුර්වේද දෙපාර්තමේන්තුව)</u>
  - III වන ශ්‍රේණිය - කාර්යාල කම්කරු / අමදින්නා/ සනීපාරක්ෂක කම්කරු/ උද්‍යාන කම්කරු
  - II වන ශ්‍රේණිය - කාර්යාල කාර්ය සහයක/ බයිසිකල් පණිවුඩකරු/ සෝපාන යන්ත්‍ර ක්‍රියාකරු/ පණිවුඩකරු/ කාර්යාල මුරකරු
  - I වන ශ්‍රේණිය - ප්‍රධාන කාර්යාල කාර්ය සහයක (ආරච්චි) / ලේඛන භාරකරු / පොත් බඳින්නා/ අනු පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු / ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු
  - විශේෂ ශ්‍රේණිය - ජ්‍යෙෂ්ඨ කාර්යාල කාර්ය සහයක

**<u>PL 02 කාණ්ඩය- III/ II/ I ශ්‍රේණි</u>**

**<u>ඌව පළාත් සෞඛ්‍ය සේවා සහ ආයුර්වේද දෙපාර්තමේන්තු</u>**

- ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය **- ඌව පළාත් සෞඛ්‍ය සේවා /ආයුර්වේද දෙපාර්තමේන්තුව**
  - වඩු කාර්මික
  - අරක්කැමි
  - පෙදරේරු
  - ජලනල කාර්මික /පොම්ප ක්‍රියාකරු
  - උපස්ථායක / උපස්ථායිකා
  - දුරකතන ක්‍රියාකරු
  - සෞඛ්‍ය රසායානාගාර සහයක
  - මැහුම් සේවිකා
- ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය **- ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව**
  - යන්ත්‍ර ක්‍රියාකරු
  - ටිකට් ලිපිකරු
  - ඖෂධ සංයෝජක
- ඕවර්සියර් /සුළු සේවා පරිපාලක **- ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව**

- **<u>PL 03 කාණ්ඩය</u>** <u>- III/ II/ I ශ්‍රේණි</u>

**<u>ඌව පළාත් සෞඛ්‍ය සේවා සහ ආයුර්වේද දෙපාර්තමේන්තුව</u>**

- සෞඛ්‍ය රියදුරු (ඌව පළාත් සෞඛ්‍ය සේවා /ආයුර්වේද දෙපාර්තමේන්තුව)
- රෝහල් ඕවසියර් ( ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව)
- විදුලි වෛද්‍ය යාන්ත්‍රික (ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව)
- විදුලි කාර්මික (ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව)

**<u>ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව</u>**

- PL-01 කම්කරු - III/ II/ I ශ්‍රේණි

- PL-02 කාණ්ඩයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය <u>තනතුරු- III/ II/ I ශ්‍රේණි</u>

  - ඕවර්සියර්
  - උපස්ථායක
  - අරක්කැමි

02. ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති සෞඛ්‍ය සේවා /ආයුර්වේද / පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවල PL-01, PL-02 සහ PL-03 කාණ්ඩයට අයත් ඉහත සඳහන් දෙපාර්තමේන්තුගත තනතුරුවල III වන, II වන හා I වන ශ්‍රේණිවල සේවයේ නියුතු නිලධරයන්ට මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකි අතර, ලිඛිත පරීක්ෂණ බදුල්ල නගරයේ පමණක් තෝරාගත් පාසැලකදීත්, අදාළ ප්‍රායෝගික පරීක්ෂණ බදුල්ල / මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් රෝහල්/ ආයතනවලදීත් / පවතවනු ලැබේ.

03. පළමු වරට විභාග සඳහා පෙනී සිටින අපේක්ෂකයින් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවුත් ඉන්පසු වාරවලදී සම්පූර්ණ පරීක්ෂණයටම ඉදිරිපත් වන හෝ විෂයන් දෙකක් සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් රු. 400/= ක මුදලක් ද, එක් විෂයක් සඳහා පමණක් පෙනී සිටින්නේ නම් රු. 200/= ක මුදලක් ද, විභාග ගාස්තු වශයෙන් ඌව පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට **"ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 "** ට බැරවන පරිදි 2026.05.20 දිනට පෙර ගෙවා ලබා ගන්නා ලද ලදුපත අයදුම්පතේ අදාළ ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එසේම මොනම කරුණක් යටතේ වුව ද ඉහත විභාග ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. මෙම විභාග පැවැත්වීම සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය විසින් පනවනු ලබන කොන්දේසි හා උපදෙස්වලට විභාග අපේක්ෂකයන් යටත් විය යුතු වේ. මෙම කොන්දේසි හා උපදෙස් උල්ලංඝනය කළහොත් ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

05. මෙම විභාගය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් https://exam.healthmin.up.gov.lk යන වෙබ් සබැඳිය ඔස්සේ මාර්ගගත අයදුම් කිරීමේ ප්‍රවේශය වෙත පිවිස 2026.05.20 දින හෝ ඊට පෙර විභාගය සඳහා මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කර පද්ධතියට යොමු කළ (Submit) පසුව, අයදුම්පතේ මෘදු පිටපත බාගත (මෙනුවෙහි Application වෙත පිවිසෙන්න) කර ගත යුතු ය. බාගත කර ගන්නා ලද අයදුම්පතේ දෘඩ පිටපතක්) ලබා ගෙන විභාගය සඳහා ගාස්තු ගෙවා ඇත්නම්, එම මුදල් ගෙවන කුවිතාන්සිය ද නියමිත ස්ථානයේ අලවා අදාළ අයදුම්පත සම්පූර්ණ කර දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2026.05.31 දින හෝ ඊට පෙර** "ලේකම්, ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, 301, ආර්.එච්.ගුණවර්ධන මාවත, බදුල්ල" යන ලිපිනයට එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන විභාගය සඳහන් කළ යුතුය. **<u>සියලුම අයදුම්කරුවන් අයදුම්පත සමඟ තම තනතුරේ වර්තමාන ශ්‍රේණියට පත්කළ/ උසස් කළ ලිපියේ පිටපතක් අනිවාර්යයෙන්ම අමුණා එවිය යුතු වේ.</u>**

06 එසේම මාර්ගගත පද්ධතිය ඔස්සේ විධිමත්ව සම්පූර්ණ නොකරන ලද හා අසම්පූර්ණ තොරතුරු සහිත හෝ වැරදි තොරතුරු සහිත අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසු ඉදිරිපත් කරනු ලබන සියලු අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ හා මුදල් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අයදුම්කරුවන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

07. සියලුම විභාග අපේක්ෂකයින් විභාග දිනයේදී තම අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් පරීක්ෂණ මණ්ඩලයේ සභාපති / විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන වලංගු ජාතික හැඳුනුම්පත
ii. වලංගු රියදුරු බලපත්‍රය

iii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iv. ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද රාජකාරි හැඳුනුම්පත

08. මෙම ශ්‍රේණිවලට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා වන විෂය නිර්දේශයන් මෙම අමාත්‍යාංශයේ https://healthmin.up.gov.lk යන නිල වෙබ් අඩවියෙන් බාගත කළ හැකි ය. එසේම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා අදාළ පරිපාටිවල සඳහන් ආකාරයට අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතු වේ.

09 මෙම විභාග සිංහල සහ දෙමළ මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. අයදුම්කරුවන් ඉදිරිපත් වන විෂයන් සියල්ලම සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර, කිසිදු හේතුවක් මත විභාගයට ඉල්ලුම් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. විභාගය පැවැත්වීමට අවම වශයෙන් දෙසතියකට පෙර ප්‍රවේශ පත්‍ර අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන විද්‍යුත් තැපැල් ලිපිනය (Email) වෙත එවනු ලබන අතර, විභාගයට අයදුම් කිරීමේ දී විද්‍යුත් තැපැල් ලිපිනය (Email Address) නිවැරදිව සඳහන් කළ යුතු ය. පෞද්ගලික විද්‍යුත් තැපැල් ලිපින නොමැති අයදුම්කරුවන් තම ආයතනයේ නිල විද්‍යුත් තැපැල් ලිපිනය සඳහන් කළ යුතු අතර, එම අයදුම්කරුවන්ගේ විභාග ප්‍රවේශ පත්‍ර එකී නිල විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කරනු ඇත. විභාගය දිනට සතියකට පෙරවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, ඒ බව අදාළ ආයතන ප්‍රධානියා මගින් මෙම අමාත්‍යාංශය වෙත අයදුම්පත්‍රයේ සහතික කළ පිටපතක් ද, මුදල් ගෙවූ ලදුපතේ සහතික කළ පිටපතක් ද, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා වට්ස්ඇප් (WhatsApp) අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීමක් කළ යුතු වේ.

10. විභාගය සඳහා පෙනී සිටින නිලධරයන් මේ වන විට සේවය කරනු ලබන තනතුරේ III/II/I ශ්‍රේණියට පත්වී සිටින / උසස් වී සිටින/ අන්තර්ග්‍රහණය වී සිටින නිලධරයන් අදාළ පරිදි පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කරන ආයතන ප්‍රධානීන් විසින් නිර්දේශ කළ යුතු වේ.

11. මෙම විභාගය පැවැත්වීම / නොපැවැත්වීම හෝ මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගැනීමේ අයිතිය ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

එච්.එම්.ජීවන්ත හේරත්
ලේකම්
ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය - බදුල්ල.
2026.05.04